# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2294/68 - 2022 අගෝස්තු මස 26 වැනි සිකුරාදා - 2022.08.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ මහනුවර මහ නගර සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන මහනුවර මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ මහනුවර මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ නාගරාජා විමලේන්ද්‍රන් අයත් වන්නා වූ එකමුතු ප්‍රගතිශීලී සංධානය (වර්තමානයේ ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ) නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ(30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නා වූද, එම මහනුවර මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා වීරන් කේෂවන් කුමරේෂන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද;

මහනුවර මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි හේවාගේ ධනුෂ්ක නලින් සම්පත් ප්‍රනාන්දු වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරමින්, වීරන් කේෂවන් කුමරේෂන්, මහනුවර මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

ආචාර්ය එච්. ඩී. එන්. සම්පත් ප්‍රනාන්දු,
තේරීම්භාර නිලධාරි,
මහනුවර මහ නගර සභාව.

2022 අගෝස්තු මස 26 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මහනුවර.

EOG 08-0271


1A - G 37349 — 16 (2022/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*